# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,275 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2022.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

**තනතුරු - ඇබෑර්තු**

**අංක 2,274 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා දින ගැසට් පත්‍රයේ පළවූ තනතුරු - ඇබෑර්තු**

**විශ්වවිද්‍යාල රෝහල**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාලය

**පුරප්පාඩු**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාල රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
(පූර්ණ කාලීන ස්ථිර පදනම මත)

**1. වෛද්‍ය නිලධාරි -I ශ්‍රේණිය**

*සුදුසුකම් :*

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

**සහ**

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මකවන ආයතනවල II ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම;

**සහ**

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 වැනි දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

**සහ**

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද ''Certificate of Good Standing'' ලබා තිබීම.

*වයස් සීමාව :*

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MO 1-1 රු.: (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

*වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. රු.78,585.00

**2. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි -I ශ්‍රේණිය**

*සුදුසුකම් :*

I. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

**සහ**

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මකවන ආයතනවල II වන ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර (09) ක පළපුරුද්ද ලබා තිබීම;

**සහ**

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 වැනි දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

**සහ**

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද ''Certificate of Good Standing'' ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MO 1-1 (රු.: 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

*දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. රු.78,585.00.

**3. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

සුදුසුකම් :

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

**සහ**

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම;

**සහ**

III.ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද ''Certificate of Good Standing'' ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MO 1-1 (රු.:58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

*වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ. රු. 64,185.00

**4. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

සුදුසුකම් :

I. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

**සහ**

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද ''Certificate of Good Standing'' ලබා තිබීම.

*වයස් සීමාව :*

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MO 1-1 (රු. : 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 01 හි තබනු ලැබේ. රු. 58,675.00

**5. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය**

*සුදුසුකම් :*

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

**සහ**

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද ''Certificate of Good Standing'' ලබා තිබීම.

*වයස් සීමාව :*

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MO 1-1 (රු.: 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

*වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ. රු.60,050.00


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

6. **වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන් - විශේෂ ශ්‍රේණිය**

- විකිරණ ශිල්පී (රෝග විනිශ්චය)
- විකිරණ ශිල්පී (චිකිත්සක)
- වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී
- භෞත චිකිත්සක
- ඖෂධවේදී
- අක්ෂි තාක්ෂණවේදී

*සුදුසුකම් :*

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

**සහ**

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කර ඇත්නම් අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබීම හා වැටුප් වර්ධක (10)ක් උපයාගෙන තිබීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 8 - රු.: (50,970 - 10 x 1,385 - 8 x 1,910 - රු. 80,100 )

*වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන් විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 3 හි තබනු ලැබේ. රු. 53,740.00

7. **හෙද පාලිකා - (විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි)**

*සුදුසුකම් :*

I. විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම;

**සහ**

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය /පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරන හා අධීක්ෂණය / ඉගැන්වීම සහ අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම් හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

**සහ**

III. තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

**සහ**

IV. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

V. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමකට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 8 - රු.: 50,970 - 10 x 1,385 - 8 x 1,910 - රු. 80,100

* හෙද පාලිකා - විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 4 හි තබනු ලැබේ. රු. 55,125.00

8. **හෙද සොහොයුරිය**

සුදුසුකම් :

I. I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

**සහ**

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය, හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.

**සහ**

III. දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම.

**සහ**

IV. පූර්වාසන්නතම වසර (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 7 - (රු. 33,295 - 10 x 445- 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

*හෙද සොහොයුරිය MT 7 පියවර 23 හි තබනු ලැබේ. රු.45,735.00

9. **හෙද නිලධාරී**

සුදුසුකම් :

I. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම.

**සහ**

III. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 7 - (රු. 33,295 - 10 x 445- 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

*හෙද නිලධාරී MT 7 පියවර 01 හි තබනු ලැබේ. රු. 33,295.00

10. **ඖෂධවේදී**

සුදුසුකම් :

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

**සහ**

III. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

**හෝ**

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන ඖෂධවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**සහ**

IV. (අ) ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**හෝ**

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*ඖෂධවේදී MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

11. **විකිරණ ශිල්පී (චිකිත්සක)**

සුදුසුකම් :

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

**සහ**

III. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී / විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**හෝ**

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**සහ**

IV. (අ). විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

**හෝ**

ආ. විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු. 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*විකිරණ ශිල්පී (චිකිත්සක) MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු.32,850.00

12. **විකිරණ ශිල්පී (රෝග විනිශ්චය)**

සුදුසුකම් :

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

**සහ**

III. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී / විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**හෝ**

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**සහ**

IV. (අ) විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

**හෝ**

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු.: 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*විකිරණ ශිල්පී (රෝග විනිශ්චය) MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු.32,850.00

13. වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී

සුදුසුකම් :

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. (අ) වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු. 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)
*වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

14. භෞත චිකිත්සක

සුදුසුකම් :

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. (අ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ භෞත චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන භෞත චිකිත්සක ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. (අ.) භෞත චිකිත්සකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් භෞත චිකිත්සකයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු.: 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*භෞත චිකිත්සක MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

15. වෘත්තිය චිකිත්සක

සුදුසුකම් :

I. සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයන් හතරකට (4) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් විෂයයන් දෙකක් (2) ක් එකවර සමත් වීම.

සහ

III. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තිය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වෘත්තීය චිකිත්සක දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. (අ) වෘත්තීය චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තීය චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු.: 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 59,360)

* වෘත්තීය චිකිත්සක MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

16. දන්ත කාර්මික ශිල්පී

සුදුසුකම් :

I. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂයය ධාරාවෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

III. පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨය/ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දන්ත කාර්මික ශිල්පී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබිම.

සහ

IV. ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු. 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

*දන්ත කාර්මික ශිල්පී MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

17. අක්ෂි තාක්ෂණවේදී

සුදුසුකම් :

I. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

III. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේ දී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

V. විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 6 - (රු.: 32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 59,360)

*අක්ෂි තාක්‍ෂණවේදී MT 6 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,850.00

18. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී

සුදුසුකම් :

I. සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම.

සහ

III. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එක හමාරක(1 1/2) පූර්ණ කාලීන වෘත්තීමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

සහ

IV. කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

MT 5 - රු. (32,405 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 58,915)

*පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී MT 5 පියවර 01 හි තබනු ලැබේ. රු. 32,405.00

19. විද්‍යාගාර සහායක

අධ්‍යාපන සුදුසුකම් :

I. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂයය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි (02) මට්ටමට (NVQ 02) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - රු. (25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)
*විද්‍යාගාර සහායක PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු.25,750.00

20. **අරක්කැමි**

අධ්‍යාපන සුදුසුකම් :

I. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂයය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි (02) මට්ටමට (NVQ 02) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - රු.: 25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)

* අරක්කැමි PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු. 25,750.00

21. **දන්ත සහායක**

අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව ඕනෑම විෂයයන් හයක් සමත් වී තිබීම.

**හෝ**

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂයය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

III. අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - (රු.: 25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)

*දන්ත සහායක PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු. 25,750.00

22. **රක්තනාලඡේදනවේදී**

අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විද්‍යාව හෝ සෞඛ්‍ය අධ්‍යාපනය යන විෂයයන් ඇතුලත් වන පරිදි සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව ඕනෑම විෂයයන් හයක් සමත් වී තිබීම.

**සහ**

II. පිළිගත් රජයේ හෝ පෞද්ගලික රෝහලකින් හෝ ආයතනයකින් රක්තනාලඡේදනවේදියෙකු (ශිරා විච්ඡේදක) වශයෙන් පුහුණුව ලබා ඇති බවට සහතිකයක් ලබා තිබීම.

**හෝ**

III. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂයයන් යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - (රු. 25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)

*රක්තනාලඡේදනවේදී PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු. 25,750.00

23. **උපස්ථායක**

අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

වයස් සීමාව :

අවුරුදූ 18 ට නොඅඩු හා අවුරුදූ 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - (රු. 25,750 - 10 x 270-10 x 300 - 10 x 330-12 x 350 - රු. 38,950)

*උපස්ථායක PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු. 25,750.00

24. **යතුරුපැදි පණිවිඩකරු/කාර්යාල කම්කරු**

අධ්‍යාපන සුදුසුකම් :

I. අධ්‍යයන පොදූ සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

වයස් සීමාව :
අවුරුදූ 18 ට නොඅඩු හා අවුරුදූ 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය :

PL 2 - (රු. 25,750 - 10 x 270-10 x 300 - 10 x 330 -12 x 350 - රු. 38,950)

* යතුරුපැදි පණිවිඩකරු/කාර්යාල කම්කරු PL 2 පියවර 01 හි තබනු ලැබේ. රු. 25,750.00

**පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය,

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වනවිට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුරු ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය හා අනෙකුත් විශේෂ ශ්‍රේණියේ නොවන තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය හා අනෙකුත් විශේෂ ශ්‍රේණියේ තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරීන් වසර එකක (1) වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක් ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක් ද දරන අතර, සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධනවලට යටත්ව).

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2022.04.18** දිනට හෝ ඊට පෙර "**විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, වේරහැර**" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

9. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත් භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

04-139/1

---

**විශ්වවිද්‍යාල රෝහල**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**

**පුහුණු තනතුරු සඳහා වන පුරප්පාඩු**

අක්ෂි තාක්ෂණවේදී/විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු/විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු

1. **අක්ෂි තාක්ෂණවේදී (පුහුණු) :**

සුදුසුකම් :

I. සිංහල භාෂාව /දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් ''භෞතික විද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් 02 ක් එකවර සමත් වීම.

*වයස් සීමාව* :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

*වැටුප් පරිමාණය* :

2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016./ උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

2. **විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු (පුහුණු)**

සුදුසුකම්:

I. සිංහල භාෂාව /දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ''ජීව විද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරක දී සමත්වීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

වැටුප් පරිමාණය :

2016.02.25 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

3. **විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු (පුහුණු)**

සුදුසුකම් :

I. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ''ජීවවිද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරකදී සමත් වීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

වැටුප් පරිමාණය :

2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

**පොදු කොන්දේසි :**

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2022.04.18** දිනට පෙර ''විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල සතුවේ.

3. ප්‍රමාදවූ, අසම්පූර්ණ හෝ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. අයදුම්පත්‍රය සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා www.kdu.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

04-139/2

අංක 2,275 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා දින ගැසට් පත්‍රයේ පළවූ තනතුරු - ඇබෑර්තු

### අධිකරණ සේවා කොමිෂන් සභාව

### වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නඩත්තු මණ්ඩලයෙහි සාමාජිකයින් පත්කිරීම - 2022

2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම(සංශෝධන) පනතේ 8 වන වගන්තියෙන් සංශෝධනය වී ඇති 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 24 වන වගන්තිය අනුව, වසර 3ක කාලසීමාවකට නඩත්තු මණ්ඩලයක් ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම හා පළපුරුද්ද ඇති ප්‍රවීණ, විශ්වසනීය, මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්වයකින් යුතු ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

1. නීතිය
2. කළමනාකරණය
3. මානව හිමිකම්
4. සමාජ සේවා
5. වෛද්‍ය වෘත්තිය හෝ උපදේශන

සියලුම අයදුම්පත් **2022.05.06** දින හෝ ඊට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12 වෙත එවිය යුතුය.

එම පත්කර ගනු ලබන්නා වූ සාමාජික මණ්ඩලයෙහි නිලධාරීන් සඳහා පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ:

1. සභාපති
   සියලු දීමනා ඇතුලත් මාසික දීමනාව - රු: 35,000/=

2. සාමාජිකයන් සඳහා
   උපරිම දින 05කට යටත්ව දිනකට ගෙවනු ලබන දීමනාව - රු: 5,000/=

එච්. සංජීව සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2022 මාර්තු මස 31 වැනි දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

04-147

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ විවෘත තරග විභාගය -2022

### Open competitive Examination for the enrollment of students for the National Diploma in Agricultural Production Technology in Sri Lanka Schools of Agriculture -2022

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හී පැවැත්වෙන "කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව" හැදෑරීම සඳහා 2021/ 2022 අධ්‍යයන වර්ෂයට අදාළව සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් 2022 ජූනි මාසය තුළදී සිංහල හා දෙමළ මාධ්‍යය වලින් ප්‍රධාන නගර කීහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වීමට අපේක්ෂිතය.

02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ 5) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, බිබිල, ලබුදූව, පාලමුණේ, පරන්තන්, වාරියපොල යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශවයටම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 1 1/2 කි. එයින් වසරක කාලයක් කෘෂිකර්ම විද්‍යාලයක් තුළදී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබාගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුළත් කරගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම් වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරික්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

2.6 පාඨමාලාව සඳහා අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත හා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පාඨමාලාවක් හදාරා ලබාගත් සුදුසුකම් මත ඉල්ලුම් කළ හැක.

03. පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :

3.1 අ. පො. ස. (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා;

3.1.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතුය.

**සහ**

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ජීව විද්‍යාව විෂයධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

**හෝ**

අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී තාක්ෂණවේදය විෂයධාරාව තුළ ජෛව පද්ධති තාක්ෂණවේදය /ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

**වැදගත්**.- ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ විෂයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැළකේ.

3.1.2 වයස :

2022.05.08 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 27 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2004.05.08 දින හෝ ඊට පෙර හා 1995.05.08 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.2. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා;

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහළ සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ.

**සහ**

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පහත සඳහන් කුමන හෝ පාඨමාලාවක් හදාරා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම මඟින් ලබාදෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) සහතිකලාභියෙකු වීම.

- පැළ තවාන් සංවර්ධන සහායක
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- උද්‍යාන අලංකරණ ශිල්පී
- භූ දර්ශන සංවර්ධන සහායක

**හෝ**

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ වෙනත් පාඨමාලාවක්

3.2.2 වයස :

2022.05.08 දිනට මෙම අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2004.05.08 දින හෝ ඊට පෙර හා 1987.05.08 දින හෝ ඊට පසුව විය යුතුය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල්වන අවස්ථාවේදී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරා ගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරඟ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයවලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිතව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී 2022 ජූනි මාසය තුළදී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේදී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදාළ අංකය ඇතුළත් කළ යුතුය. එම තෝරා ගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගර අංකය | නගරය |
|---|---|
| 1. | අම්පාර |
| 2. | අනුරාධපුරය |
| 3. | දඹුල්ල |
| 4. | ගම්පහ |
| 5. | ගාල්ල |
| 6. | හම්බන්තොට |
| 7. | මහනුවර |
| 8. | කුරුණෑගල |
| 9. | වව්නියාව |

4.3 කිසියම් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැතිවිට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

5. පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කළ යුතුය.

5.2 විභාග ගාස්තුව රු.750.00කි. මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කළ දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය.

5.3 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කළ යුතුවේ. අයදුම්පත සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 0812 388 340 හෝ 0812 388 341 යන දුරකතන අංකවලින් විමසීමක් කළ හැක.

5.4 විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

5.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2022.05.08** දිනෙන් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.6 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කළ අයදුම්පතේ දෘඩ පිටපතක් ලබා ගැනීම අනිවාර්ය වේ.

5.7 එසේ ලබාගත් දෘඩ පිටපත පහත සඳහන් ඇමුණුම් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2022.05.11** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 5)" යන්න සඳහන් කළ යුතුය.

ඇමුණුම් :

අ. අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා

i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
iv. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

*ආ.* ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා -

i. අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
ii. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතිකය
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
iv. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.8 ඇමුණුම් ද සහිත අයදුම්පතෙහි දෘඪ පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාල ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. *අනන්‍යතාවය සනාථ කිරීම :*

6.1 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථකළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුවේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

07. *කොවිඩ් -19 ආසාදනය වැළැක්වීමේ ක්‍රියාමාර්ග :*

7.1 විභාග මධ්‍යස්ථානයට ඇතුල්වීමේ සිට විභාගය අවසන්ව නික්ම යනතුරු කොවිඩ් වැළැක්වීමේ මාර්ගෝපදේශයන්ට යටත්ව ක්‍රියා කළ යුතුවේ.

08. විභාග ක්‍රමය :

8.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහාම ලකුණු 100 බැගින් ලබාදී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු 200න් කොපමණද වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

8.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

8.3 විෂයය නිර්දේශය

කෘෂිකර්මය : අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන විෂයය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ මාදිලියේ ප්‍රශ්න අඩංගුවේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

බුද්ධි පරීක්ෂණය : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

8.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුල වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඊට අදාල ලදුපත ඇතුළුව 5.7 හි සඳහන් අනෙකුත් ඇමුණුම් සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මගින්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැණුම් දෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 0812388 085 හෝ 081 2388059 යන දුරකතන අංකවලින් විමසීමක් කල හැක.

8.5 අයදුම්පතේ සඳහන්කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ග වන විද්‍යුත් තැපැල් ලිපිනය, Whatsapp අංකය හා දුරකතන අංක බඳවාගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

8.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරිය ලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය.

8.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

8.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කලහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

8.9 තරග විභාගයේදී සිසුන් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැලකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී අධ්‍යාපනික හා අදාල අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

8.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

09. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

9.1 පාඨමාලාව සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි 10% ක ප්‍රමාණය ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

9.2 අදාළ වර්ෂයේදී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කරගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

10. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය එස්. එච්. එස්. ඒ. ද සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2022 මාර්තු මස 24 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

04-111

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2022**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටි මීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.
**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද, MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලය : මාස 5 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000/-

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද, පුහුණුවද ලබා දේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 22,000/-
NVQ සහතිකපත් පාඨමාලාව රු.31,000/-

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලය : මාස 6 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000/-

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨාමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000/-

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

කාලය : මාස 08 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරත වූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප, නිර්මාණකරනය කිරීම හා එම රූප රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000/-

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැනනගින දෘඩාංග/මෘදුකාංග වලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ටද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04(අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000/-

**ඕෆ්සෙට් පත් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුලත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන)
මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000/-

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : මස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000/-

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන)
මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000/-

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම Design for Print**

මුද්‍රණ රටා නිර්මාණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000/-

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙම විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000/-

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750/-

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂෙත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන : 0662222172, 071 0554298.

04-119

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019 (2022)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 14 |
| 02 | උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 03 |
| 03 | පෙර මුද්‍රණ සැලසුම්කරු | 01 |
| 04 | කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | 08 |
| 05 | මුද්‍රණ නිමැවුම්කරු | 02 |
| 06 | මුද්‍රණ කාර්මික | 02 |

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම හා කුසලතාව මැන බැලෙන වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. එහිදී විභාග කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද (අංක 05 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

02. *සුදුසුකම්* :

I. *සාමාන්‍ය සුදුසුකම්* :

- අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
- යම් ආගමික නිකායක පැවිදිවරයකු නොවිය යුතුය.
- දිවා රාත්‍රී රාජකාරි ඉටු කිරීමට සිදුවන බැවින් පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන් හි V වැනි පරිච්ඡේදය අනුව රාජ්‍ය සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තකු නොවිය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. ඒ අනුව 2004.04.29 දිනට හෝ ඊට පෙර හා 1987.04.29 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

II. *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) සමත් වීම.

*(ආ)* කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරු තනතුර සඳහා පමණක් ඉහත (අ) හි සුදුසුකම්වලට අමතරව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමර්ථයක් ලබා තිබීම අවශ්‍ය වේ.

III. *වෘත්තීය සුදුසුකම්* :

*(අ)* ඒ ඒ තනතුර අයත් ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 4 මට්ටමේ හෝ එම කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන එක් එක් ක්ෂේත්‍රයට අදළ ඒ හා සමාන මට්ටමේ වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

*සටහන.-* මුද්‍රණ කාර්මික තනතුර සඳහා මුද්‍රණ කාර්මික හා/හෝ විදුලි කාර්මික ක්ෂේත්‍ර අදළ කර ගනු ලැබේ.

IV. *පළපුරුද්ද* : ක්ෂේත්‍රයට අදළ තනතුරක වසර 05ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

*සටහන.-* ක්ෂේත්‍රයට අදළ තනතුරක අදළ පළපුරුද්ද සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී ඉතිරි පුරප්පාඩු සඳහා සේවා පළපුරුද්ද හැර අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් වසරක පුහුණු කාලයකට යටත්ව බඳවා ගනු ලැබේ.

V. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරු වේ.

III. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට පත්වී වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ 3 වන උපලේඛනයේ දැක්වෙන පරිදි 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් නීති රීති හා කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් විධිවිධාන හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

V. සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී දෙකෙහිම සේවය කළ යුතු අතර පවතින රාජකාරි අනුව නිවාඩු දිනයන් හි ද නොපිරිහෙලා තම සේවය ලබා දීමට එකඟ විය යුතුය.

04. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු.29,840-10x300-11x350-10x560-10x660-රු.48,890- (MT 1 - 2016) මාසික වැටුප් පරිමාණයක් හිමිය.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ. :

මෙම සම්මුඛ පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ලකුණු දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| I. අධ්‍යාපන සුදුසුකම් | 30 |
| II. වෘත්තීය සුදුසුකම් | 30 |
| III. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 35 |
| IV. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| මුළු ලකුණු | 100 |

ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණය ඇතුළත ලකුණු ලබා දීම සිදු කෙරේ. එම ලකුණු ප්‍රදානය කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු අතර, අදාළ තනතුරුවල ස්වභාවය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් කුසලතාව මැන බැලෙන වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ.

*සටහන* :

I. වෘත්තීය පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතාවය අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

II. වසරක පුහුණුවකට යටත්ව කරනු ලබන බඳවා ගැනීම් වල දී, වසරක පුහුණුවෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය සමත්වන, අයදුම්කරුවන් පමණක් ස්ථිර පදනමින් තනතුරට බඳවා ගනු ලැබේ.

06. *පරීක්ෂණ ගාස්තු* :

පරීක්ෂණ ගාස්තුව රු.250.00කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ 2022.04.29 දින හෝ එදිනට පෙර හෝ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ඉදිරිපත් කරනු ලබන එක් එක් අයදුම්පත සඳහා වෙන වෙනම පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

07. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

i. අයදුම්පත් 2022.04.29 දිනට හෝ එදිනට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, ආයතන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පතේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුවේ අංක 01 සිට 06 තෙක් ඡේදයන් ද, ඉතිරි ඡේදයන් සෙසු පිටුවලට ද ඇතුළත්වන සේ පිළියෙල කර ගත යුතුවේ. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

*නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත පරීක්ෂණ ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ.

iii. අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2019 (2022)" ලෙස සඳහන් කර එවිය යුතුය. තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

iv. අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

v. මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

08. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම* :

i. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරීක්ෂණ ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත.

ii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කැඳවීම් ලිපියක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

iii. අයදුම්කරුවන් වෙත කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් තම කැඳවීම් ලිපිය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් කැඳවීම් ලිපියේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

iv. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

09. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* :

අපේක්ෂකයින් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව පැමිණිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඇතුළත් කර නොගැනේ. තව ද, සම්මුඛ පරීක්ෂණය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ නීති ක්‍රියාමාර්ගයන්ට යටත්ව රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එල්. එම්. ඩී. ධර්මසේන,
විභාග කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 08 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව***

කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2019 (2022)

Structured Interview for Recruitment to Grade III Posts of Management Assistant Technological Segment 3 Service Category - 2019 (2022)

(අංක හෝ සංකේත සඳහන් කළයුතු අවස්ථාවලදී දෙන ලද කොටුව තුළ පැහැදිලිව හා නිවැරදිව සංකේතය / අංකය සටහන් කරන්න)

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

සිංහල - 2 / දෙමළ - 3 /ඉංග්‍රීසි - 4

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

| ඉල්ලුම් කරන තනතුර | |
|---|---|

(අයදුම් කරන තනතුරට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

| *තනතුරු නාමය* | *අංකය* |
|---|---|
| 1. ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 |
| 2. උන්නත මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 |
| 3. පෙර මුද්‍රණ සැලසුම්කරු | 3 |
| 4. කොම්පියුටර් ටයිප් සෙටර් සහ මුද්‍රණ රටා සිත්තම්කරු | 4 |
| 5. මුද්‍රණ නිමැවුම්කරු | 5 |
| 6. මුද්‍රණ කාර්මික | 6 |

1. 1.1 සම්පූර්ණ නම :——————
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා* :- BANDARA A.B.C

1.3 සම්පූර්ණ නම :——————.
(සිංහලෙන්/දෙමළෙන්)

2. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර පදිංචි ලිපිනය :——————.
(සිංහලෙන් / දෙමළෙන්)

2.3 කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ පුරුෂ - 0 ස්ත්‍රී - 1

4. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6. 6.1 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයසඃ (2022.04.29)

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

7. විවාහක / අවිවාහක බව : ☐ විවාහක - 01 අවිවාහක - 02

8. *අධ්‍යාපන සුදුසුකම්* :

8.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය
විභාගයට පෙනී සිටි වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.

| විෂයය | සාමර්ථ්‍ය | විෂයය | සාමර්ථ්‍ය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

9. *වෘත්තීය සුදුසුකම්* :

| පාඨමාලාව | හැදෑරූ වර්ෂය | තාක්ෂණික ආයතනය | NVQ මට්ටම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9.1 ඔබ විසින් ඉදිරිපත් කරන සෑම සහතිකයක්ම කුමන NVQ මට්ටමකින් පිළිගනු ලබන්නේ ද යන්න පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලබාගත් ලිපියක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

10. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :
.............................................................................................................

11. වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :
.............................................................................................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :
.............................................................................................................

13. පරීක්ෂණ ගාස්තු ගෙවීම පිළිබඳ විස්තරඃ
13.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලයේ නම :————.
13.2 ලදුපත් අංකය හා දිනය :————.
13.3 ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

14. *අයදුම්කරුගේ සහතිකය* :

14.1 මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

14.2 ම විසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

14.3 තව ද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

14.4 මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

ඉහත නම සඳහන් ........................................................ මහතා/ මහත්මිය / මෙනවිය මා හොඳින් දන්නා බවත්, අද දින මා ඉදිරිපිට දී ඔහුගේ / ඇයගේ අත්සන තබන ලද බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

——————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
දිනය :——————.

16. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. :

ඉහත විස්තර සඳහන් .................................................... මහතා/ මහත්මිය /මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු / ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

නම :——————.
පදවි නාමය :——————.
ලිපිනය :——————.
දිනය :——————.

04-177

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුද දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : (IIආ) ඡෙදය හා I කොටස : I ඡෙදය යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2022.04.08 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk